
ඔබ නිරය
හෝ
ස්වර්ගය
තෝරාගත යුතුයි

# ඔබ නිරය හෝ ස්වර්ගය තෝරාගත යුතුයි

## ඔබ තෝරා ගන්නේ කුමක්ද? ඔබගේ සදාකාලය ඔබ කොහේද ගත කරන්නේ?

**ඔබ තීරණයක් ගන්නට පෙර, කරුණාකර මතු සඳහන් සත්‍යතාවයන් සලකා බලන්න:**

1. “තවද එක් වරක් මරණයත් ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබෙන්නාක්මෙන්,”හෙබ්‍රෙව් 9:27

2. “සෑම මනුෂ්‍යයෙක්ම පව්කරයෙක්ව උපත ලැබ, පාපයෙන් උපත ලබා ඇත, මෙය ඔහු උරුමකරගණු ලැබුවේ, දෙවිදුන්ට විරුද්ධව පව් කළ පළමු මනුෂ්‍යයා වන, ආදම්ගෙන්ය. “බැලුව මැනව, මම අයුතුකම සහිතව සාදනු ලැබීමි; මාගේ මෑණියෝ පාප සහිතව මා ගැබ්ගත්තාය.” (ගීතාවලිය 51:5).



“එහෙයින් එක මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත් පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල් වුණාක්මෙන්. සියලු මනුෂ්‍යයන් පව් කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුනේය. (රෝම 5:12)



3. “ එබැවින්, මනුෂ්යයා තමන්ගේ පාප නිසා

යක්ෂයාට වහලෙක්ව සිටියි.
"සැබෑවක් සැබෑවක් නුඹලාට කියමි
පව්කරන සියල්ලෝම පාපයේ
වහල්ලුය. නුඹලා නුඹලාගේ පියාගේ
තෘෂ්ණාවන් ඉෂ්ටකරන්ට කැමතිය."
(යොහාන් 8: 34,44 )



4. "යහපත් ක්‍රියාවන්, දිවුරුම්,
පොරොන්දු පාවිච්චි කර හෝ
මිනිසා විසින් සාදන ලද, හේතුධර්ම
ශාස්ත්‍ර හෝ ලෝකයේ ධර්මයන්
පාවිච්චි කර, කිසිම මනුෂ්‍යයෙකුට ගැළවෙන්ට බැරිය.
ඔහු වහලෙකි, ඔහුට, ඔහුවම මුදවා ගන්නට බැරිය.
"තමාගේ සහෝදරයා සදාකල් ජීවත්වන පිණිසද කුණුවීම
නොදක්නා පිණිසද ඔහු නිදහස් කරන්ටවත් ඔහු උදෙසා
දෙවියන්වහන්සේට මිදීමේ මිලයක් දෙන්ටවත් කිසිසේත්
සමර්ථ නොවේ." ගීතාවලිය 49: 7,8

5. දෙවිතුමන්ගේ අවසාන විනිශ්චය නම්, සියලු
පව්කරුවන්ට සදාකාලික දඬුවමයි, එය ගිනිවිලය: මන්ද,
දෙවිතුමන් ශුද්ධය, අපවිත්‍ර තැනැත්තෙකුට හෝ දෙයකට,
දෙවිතුමන් අභිමුවේ පවතින්ට බැරිය.
"මක්නිසාද පාපයේ කුලිය නම් මරණය;
නුමුත් දෙවියන්වහන්සේගේ දිමනාව නම්,
අපගේ ස්වාමිවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේ
තුළ සදාකාල ජීවනයය." රෝම 6:23



**සකළ ජනතාව පව්කාරයන්ව, යක්ෂයාට වහලුන්ව සිටියත්, දෙවිතුමන්, උන්වහන්සේගේ අනුපමේය ප්‍රේමය කරණකොටගෙන, එතුමන්ව අදහා, විශ්වාස කරණ සෑම කෙනෙකුටම, ගැලවීමට මාර්ගයක්, මතු සඳහන් ආකාරයට සාදා දී ඇත:**



1. ඔබගේ සියලු පාප යෙසුතුමන්ට කියාසිට අත්හැර, ඔබ පව්කරුවෙකු බව වටහාගෙන, පසුතැවිලිවන්න. "නුඹලාගේ පාපය මකාදමනු ලබන පිණිසද, පශ්චාතාපව හරියල්ලා." ක්‍රියා 3:19.

"අපගේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කාමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක." 1යොහාන් 1:9

2. යේසුකිතුතුමන්ගේ නාමය හඬ ගසමින්,ඔබගේ ගැලවීම උදෙසා සුභාරංචිය අදහන්න. "නුමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විදීමෙන්ය." (රෝම 5: 8).



3. වතුර බව්තිස්මය ලබන්න, මක්නිසාද, ඔබ අදහන විට, ඔබගේ සියලු පාපයන්ට කමාව ලැබුණත්, පූර්ණවූ නව ජීවිතයක් ගතකරණ පිණිස, පාප ස්වභාවය "පරණ මනුෂ්‍යා" මැරී භූමිදානය කරණු ලැබියයුතුයි. "බව්තිස්මය කරණකොටගෙන උන්වහන්සේ සමග තැන්පත්කරනු ලැබුවෙමුව.'

4. ඉන්පසු, ඔබට ශුධාත්ම බව්තිස්මය බව්තිස්මය ලබාගත හැක (අන්‍ය භාෂා ලකුණු සමග). යක්ෂයාට පාපය තුළ සේවය කිරීමට, ඌ ඔබව ශක්තිමත් කළාසේ, ධර්මිෂ්ඨකමින් සහා ශුද්ධකමින් යුක්තව දෙවිතුමන්ට සේවය කරණ පිණිස,එතුමාණෝ ඔබව, ශුද්ධාත්මයාණාන් තුළින් ශක්තිමත් කරනසේක. "නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය.එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහි ද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නාහුයයි කිසේක." ක්‍රියා 1:8



# තීරණය ඔබගේය

## නිරය:

යක්ෂයාට පාපය තුළින් අඛණ්ඩව සේවය කරන්නට මා තීරණය කරමි



දෙවිතුමන් මා හට සපයාදී තිබෙන, එතුමන්ගේ ප්‍රේමය සහ මිදීම මා ප්‍රතික්ෂේප කරමි

බේරීමක් නැති, මුළු සදාකාලයෙහිම නිරාගින්නෙහි සිටීමට, මා අදිටන් කරගනිමි

"ශාපලත්තෙනි, මා කෙරෙන් පහව යක්ෂයාටත් ඔහුගේ දූතයන්ටත් සූදානම්කර තිබෙන සදාකල ගින්නට පලයල්ලා." (මතෙව් 25:41)

# ස්වර්ගය:



දෙවිතුමාණන්, ස්වාමිවූ යේ
යේසුකිතුතුමාණන්,
ඇදහීමෙන් පමණක්ම
සපයා දී ඇති මිදීම
කරණකොටගෙන
යක්ෂයාගේ වහල්භාවයෙන්
සහ යක්ෂයාගෙන්
බේරෙන්නට මම
තීරණයකරමි.

ශුද්ධවූ දෙවිතුමන්ට ධර්මිෂ්ටකමින් යුක්තව කිකරුවී සේවයකරන්නට මා තීරණය කරමි

දෙවිතුමන්ගේ පොරොන්දුව පරිදි, මුළු සදාකාලයේදීම එතුමාණන්ගේ ශුද්ධ නගරයේ සිටීමට, මා අධිෂ්ඨානය කරගත්තෙමි. “යහපත්වූ විශ්වාසවූ දාසයා, ඒ යහපත; ස්වල්ප දේ ගැන නුඹ විශ්වසවුවෙහිය, බොහෝ දේ කෙරෙහි ඔබ අධිපති කරමි. නුඹේ ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල්වෙයන්නැයි ඔහුට කිවේය. ” (මතෙව්25:23)

